




**'අසෙනිය කුසුම' තීරුව දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## යෝධයාගේ උයනේ සිරවූ බිරිඳ

**කවුළුව සෙමෙන් විවර කර**
**සුළඟ එන පෙරමග බලයි**
**අඳුරේ නොදල්වා පහන**
**සඳ කිනිත්තක් අහසේ සොයයි**

**බලකොටුව උයනක් ද**
**කුරව් කෙවිල්ලන් ගෙන් අසයි**
**එල දරන්නේ කොහොම**
**තුරුලතා අතර හිඳිමින් සිතයි**

**මේ දන්න මල් සුවඳ හැර**
**තව තවත් සුවඳ මල් ඇති ද**
**සෙමෙන් පණනල හරින**
**පෙති හැළෙන මලක් සිඹිමින් සිතයි**

**වැහි බිඳක් වැටෙන විට**
**සුමුදු සියුමැලි දෝත පා**
**කඳුළු බිඳුවක හැඩරුව ඇති ද**
**උණුසුමින් තුරුලු කරගෙන බලයි**

**වාලුකා කතරකට**
**වැසි වැටෙන සෘතුවක් නැති ද**
**කැලැන්ඩර් පිටු අතර**
**ඉලක්කම්, මාස ගනිමින් සොයයි**

**දෙපා මිරිකා හරින**
**තිත්ත වේදනා බර හිස දරයි**
**ගැඹුරු නින්දට වැටෙන ඔහු අතැර**
**හොරෙන් කඳුළකින් කවියක් ලියයි**

**පස් අතර කාලයක් මුල් අදින**
**වැටුණු තුරුපත් අතර පොහොර වන**
**ආදරේ පාට කොයි වගේ දැයි**
**පාට නැති වළාකුලකින් අසයි**

**කපිල එම්. ගමගේ**
('තෙරියුම් කෝකිලා' කාව්‍ය සංග්‍රහය - 2016)

එක්ටැම් මැදුරක සිරකළ හුදකලා කුමරියකගේ මතක කැටුව එන මේ කවිය නම් කොට ඇත්තේ 'යෝධයාගේ උයනේ සිරවූ බිරිඳ' නමිනි. කවිය කියැවීමටත් පෙර කවියෙන් කියන්න හදන්නේ කුමක්ද යන්න ගැන ඉඟිකරන අප කවියා එසේ කළේ ඇයිද යන ප්‍රශ්නය මා සිතේ මුලින්ම පැන නැගුණි. නමුත් කවිය කියවන්න පටන් ගත් පසු ක්‍රමයෙන් ඉතා විචක්ෂණශීලීව සියුම් ඉඟි බිඟි හා සංසිද්ධි ඔස්සේ අප කවියාට අනුභූතිය සැපයූ කාන්තාව එනම් ඒ බිරිඳගේ ජීවිත පදාසයන් අප හමුවේ තබා ඒ ජීවිතය තේරුම් ගන්නට අපට මෑනැවින් ඉඩ ප්‍රස්ථා තනයි.

කවියේ මාතෘකාවට අනුව යෝධයාගේ උයනේ සිරවූ බිරිඳ යැයි කියූ සැණින් අප සිතේ පහළ වන්නේ ඇගේ කුරා කුහුඹු ස්වාභාවයයි. මෙහිදී ස්ත්‍රිය හෝ බිරිඳ කෙරේ සමාජය විසින් බලන්නට නියම කරන ලද දෘෂ්ටිකෝණයට අනුව ඈ කුඩා චරිතයක් වියයුතු යැයි අනුබල දෙන දෘෂ්ටිවාදය සියුම් ලෙස උත්ප්‍රාසයට නැංවෙන ආකාරය කදිමය. එය මාතෘකාවේ නොරන්දා කවි සිරුර ඇතුළට අරන් ආවා නම් ඊටත් වඩා යෝග්‍ය යැයි මට සිතේ.

විසල් යෝධයකුගෙන් බලය හිමි ගෘහමූලික ස්වාමිපුරුෂයකු සංකේතවත් වන අතර ඔහුගේ උයන ඔවුනගේ කුටුම්බයයි. ඈ එහි සිරගත බිරිඳයි. බැලූ බැල්මට පිටින් පෙනෙන සෞභාග්‍යවත් ගෘහ ජීවිතය ඇතුළේ එක පාරටම නොපෙනන තිත්ත යතාර්ථයක් කරා කැඳවාගෙන යාමක් මේ කවියේ අන්තර්ගතය. එනම් පුරුෂ මූලික වෛවාහක දිවිය ඇතුළේ ස්ත්‍රිය සියුම් ලෙස අවතක්සේරු වන හැටි හා ඒ අභිමිවීම ඇතුළත ආත්මීය වශයෙන් ස්ත්‍රිය කොතරම් පීඩාවකට පත්වන්නේද යන්නත්, ඉන් මිදීමට ඈ විසින් කුමන විකල්පයන් සොයන්නේද යන්නත් මෙහිදී නිරීක්ෂණය කළ හැක.

මේ ඉතා පොදු මානව ජීවන අත්දැකීමකි. නමුත් කවි සිරුරේ පළින් පළින් මතුකරන, මතුවන්න ඉඩ හරින ජීවිතයටම අනුබද්ධ ඉංගිතයන් අපටත් බලා ගන්නට ඉඩහරිනාකාරය නැවුම්ය; සියුම්ය. පමාවී නිවසට පැමිණෙන ස්වාමිපුරුෂයාට ඒ වෙනුවෙන් ඔහුටම අනන්‍ය හේතු සාධක දහසක් තියෙන්නට පුළුවන. ඔහු එසේ පැමිණෙන්නේ නිකම්ම නොව, මත් වතුරින් මත්වී සිහි මඳ ස්වරූපයෙන් යැයි හැඟෙන්නේ ඔහු දෙපා සම්බාහනය කොට වේදනාවන් නිවාරණය කරලීම පැවරී ඇත්තේ බිරිඳට යැයි හැඟෙන නිසාය. එය හිස පවා වේදනාවෙන් බර කරන කාඩ තිත්ත අත්දැකීමකි. නමුත් ඉන් මිදීමක් නොමැත. දින චරියාවේ අංගයක් මෙන් හැමදාම ඈ එසේ කළ යුතුය. ඒ ඔහුට නින්ද යන තුරුය. ඈ සිරකාරියක්ම පමණක් නොව, වහලියක්ද වන්නේ මෙන්න මේ අර්ථයෙනි. නමුදු එක අතකින් මේ හුදකලා ස්ත්‍රියට එය සුවයක් ගෙනෙන්නේ ඉන් අනතුරු ඔහු ගැඹුරු නින්දකට වැටෙන නිසාවෙනි. ඒ මොහොත ඈ රහසේම තමන්ගේ හිත පතුලේ පැසවනා දුක්ඛ දෝමනස්සයන් කවි පදවල බහාලන මොහොතයි. එය ඈට අල්පමාත්‍රීය සහනයක් හිතට කැඳවන්නේය.

ගැඹුරු නින්දේ පසුවන තම හිමියාගේ නින්දට බාධා නොවන අයුරින් කුටුම්බයේ කාමරයේ පහන් නිවා ඇත. ඈ එවැනි මොහොතක සීරුවට කවුළුව සමීපයට ගොස් එය විවර කරන්නේ සුළං රැල්ලක් වත් අහුලාගනු රිසියෙනි. හිස බරකරන වේදනාවන් ගෙන් අංශුමාත්‍රීය හෝ සහනයක් ලබා ගන්නට මේ සුළං සුව උදව් වේ. අඳුරේම ඈ ඇගේ හුදකලාව මකා ගැනීමට සඳ ලපයක් අහසේ සොයයි. ඈට ඇගේ දුක කියා හිත නිදහස් කරගන්න කවුරුත් නැත. ඈ බාහිර පරිසරයෙන් වියුක්ත වුණු කුටුම්බයටම පමණක් සීමාවුණු සිරකාරී බිරිඳකි. ඉතින් ඈ වෙනුවෙන් ඉන්නේ සොබාදහම විනා වෙන කවුරුවත් නොවේ. ඈට ඒ හැඟීම මෙ-ර්චනය කරගන්න, දුක පිට කරගන්න වී ඇත්තේ තනිවමය. එය කිසිදා නොසංසිඳෙනා වේදනාවකි.

ඈට ජීවත්වන්න සිදුවී ඇති පරිසරය එනම් වත්ත පිටිය තම ස්වාමිපුරුෂයාගේ දේපොලයි. සමහරවිට ඒ බලෙන්ම ඈගෙන් පැහැරගත්තක්ද විය හැක. ඒ කෙසේ වෙතත් දැන් ඒ පෙදෙස නපුරු යෝධයකුගේ බලකොටුවක් සරිය. වත්තට එන කුරව් කෙවිල්ලන්ගෙන් ඈ අසන්නේ එවන් බලකොටුවකට කිසිදා උයනක් විය හැකිද කියාය. ඈ ඉන්න මානසික තත්ත්වය මත, ඈ සිතන්නේද වත්ත පිටියේ සරන නිදහස්කාමී කුරුල්ලනුත් ඈ වැනිම දුකක් උහුලා ජීවත් වනවා කියාය. කෙනෙකුට තමන් සිතන සීමාවෙන් එහාට සිතිය නොහැක. මේ අවස්ථාව එය මැනෙවින් තහවුරු කරයි. ඈ තුරුලතාවලින්ද අසන්නේ එවන් බලකොටු පරිශ්‍රයක කොහොම එලදරනවාද කියාය. මෑ දරු පැටියෙකුට ආසාවේ සිටිනවා විය හැක. නමුදු තවම ඒ පැතුම් සඵල වන ලකුණක් නැත. ඇගේ යටිහිතේ පැසවන මේ අහිංසක ආසාව එල නොදරන තාක් ඈට සෑමදාම මේ ප්‍රශ්නය වත්ත පිටියේ එලදරන තුරු වැල්වලින් ඇසිය හැක. එය ප්‍රබල උත්ප්‍රාසයක් ජනිත



නොකරන්නේද?

මැලවී වියැකෙන පෙති හැළෙන මලක් අත රැඳවාගෙන ඊට හිමි පරමල් සුවඳ හැර වෙනත් මල් සුවඳවල් තිබේ දැයි ඈ ඈගෙන්ම අසයි. ඒ පර මලේ සුවඳ යනු ඈ හොඳින්ම දන්න හඳුනන සුවඳයි. කෙමෙන් වියැකී යන ඇගේම ජීවිතය සංකේතීයව හුවා දක්වන්නට පෙති පෙති ගිලිහෙන මලක් යොදා ගැනීම ඉතා උචිත අතරම, ස්ත්‍රියකගේ සිතක් සොරකම් කරගත හැකි, ඈව කිති කැවිය හැකි වෙනත් මල් සුවඳවල් තියේ දැයි ඈ සිතන්නේ ඈට මේ කුටුම්බය ඇතුළත නම් එවැනි ප්‍රහර්ෂීය මොහොතක් කිසිදාක නොලැබී ඇති නිසාවෙනි. ඇගේ ස්ත්‍රී යටි සිතේ එවැනි ආශාවන් වෙනුවෙන් තවමත් දොර කවුළු හැරී ඇති බැවිනි.

කඩා හැලෙන වැස්සෙන් අත්ල මත රැඳුණු එක වැහි බිඳක් පවා කඳුළක හැඩය ගෙන ඇති බවක් මෙහි කියැවේ. පරිසරයේ සියලුම අංගයන් ඇගේ මේ සිරගත හුදකලා දිවිය සංකේතවත් කරනාකාරය අපූරුය. මේ සියලු සංවාදයන් ඈ අතින් සිදුවන්නේ පරිසරය ඇසුරිනි. නමුදු ඒ තමන්ගේම හුදකලාවට එදිරිව තමන්ගේම සිතත් සමගය. දින සති මාස ගෙවි ගෙවී ගියද පොඩි හෝ සුබදායී සිහිනයක ලකුණක්වත් අසලක නැත. කැලැන්ඩර් පිටු එකින් එක පසුවී ගියද ඇගේ ජීවිතය හඟවන මේ වාලුකාවට වස්සාන සෘතුවක් එනම් කුමනාකාරයේ හෝ සුබ නිමිත්තක ඡායාවක් අත නුදුරක වත් නැති සෙයකි.

බලකොටුවක සිරගත කළ ස්ත්‍රියක් වුවද, කොතරම් හුදකාලමය බරක් උසුලන් සිටියද ඈ සිතේ නිල් එළියක් වෙනුවෙන් බලාපොරොත්තු නොනැසී පැවතීම ඈට ජීවත් වන්නට අවශ්‍ය හුස්ම පොද ලබාදෙයි. එකින් එක ලිහී ගිලිහෙන තුරු පත් තුරු මුලම පොහොණී වනු ඈ දකී. ඒ පස් කැට්ති අතර හෙම් හෙමින් අලුත් ළදලු නැග එනු ඈට පෙනෙයි. එය ඈට බලපොරොත්තු ඇති කරයි. දලු ලා වැඩෙන රිකිලි ඉතා ඉක්මනින් පාට පාට මල් හිස ගවසනු ඇත. එය ආදරය වැනිය. නමුත් ඈ තවම එය දැක නොමැත. ඇගේ දිවියටත් ඒ අතු රිකිලි වාගේම ආදරයේ පැහැය තවම අහිමිය. නමුත් නුදුරු දිනකම එය සිදුවිය හැක. පාට නැති වළාකුලකින් ඈ අසන්නේ ඒ පූදින්න නියමිත මල් පොහොට්ටුවල පාට මොන වගේද යන්නයි. මේ සියල්ලම තමන් සමගම සිදුවන ඉතා සියුම් අන්තර්භාෂණයන්ය. ඒවාට පිටතට ඇසෙන හඬවල් නැත. නමුත් මහා දෝංකාරවත් හඬවල් දහස් ගණනින් උරුමය. ඈ වෙනුවෙන් කවදා හෝ දිනක සතුටක් එනම් ආදරයක් කොහේ හෝ තැනක දලු ලනු ඇත. ඒ පිළිබඳ ඈට මහා විශ්වාසයක් ඇත. නමුත් දැනටමත් ජීවිතයෙන් බැටකන ඈට ඒ වෙනුවෙන් විසල් බලාපොරොත්තු ගොන්නක් රැඳවාගෙන හීන රැසක් දැක දැක සිටිය නොහැක. ඒ හීන කුඩුවී සුනු විසුනු වී යාවී යැයි යන බියෙන් ඈ එවිට තැති ගනු ඇත. නමුත් කිසිදා ආදරයක් නොලද ඈ පාටක් නැති වළාකුලකින් පිපෙන්නට නියමිත මල්වල පාට එනම් ආදරයේ පාට ඇසීම ආයෙමත් ඇති කරන්නේ උත්ප්‍රාසයක්මය. ඒ මන්දයත්, පාට නැති වළාකුල සංකේත්වත් කරන්නේ ඇගේම අවර්ණ ජීවිතය බැවින්ය.

අප සමාජයේ සුලභ සංසිද්ධියක් මනා රූපකාර්ථවත් ස්වරයකින් නවමු ආකරයකින් ඉදිරිපත් කිරීමට මේ කවිය ඇතුළත අප කවියාට හැකි වී ඇත. කුටුම්බයක සිරගතවුණු බිරිඳකගේ ස්වරය ඈ චිත්ත අභ්‍යන්තරයට පිවිස ඉතා සියුම් ආකාරයකින් අපට කියවාගැනීමට ඉඩ සලසන මේ කවිය විරෝධාකල්ප ස්වරූපයෙන් සැමියාට එරෙහිව අවි අමෝරාගත් ගැහැනියකගේ ස්වරයෙන් හෝ සමාජයේ අනුකම්පාව දිනා ගැනීමේ චේතනාවෙන් පීඩිත ගැහැනියකගේ වේදනාත්මක අඳෝනා ස්වරයෙන් නොකියැවී ඉතාම ආත්මීය ආකාරයන් අව්‍යාජ ලෙස ලියැවී ඇති නිසාම සාර්ථකත්වය ලබා ඇතැයි යන්න මගේ හැඟීමයි.

සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com